# ළමා සුරැකුම් ප්‍රතිලාභ සහ ළමා සුරැකුම් බදු වට්ටම්



## Child Care Benefit and the Child Care Tax Rebate—Sinhalese

අනුමත සහ/හෝ ලියාපදිංචි සුරැකුම් සේවා ලබාගන්නා පවුල් සඳහා ළමා සුරැකුම් වියදම් සම්බන්ධයෙන් ළමා සුරැකුම් ප්‍රතිලාභ උපකාර කරයි. ළමා සුරැකුම් බදු වට්ටම් යනු රැකියාවල නියුක්ත පවුල් සඳහා ළමා සුරැකුම් වියදම් වලට ආධාර වන අමතර සහායකි.

## ළමා සුරැකුම් ප්‍රතිලාභ ලබා ගත හැක්කේ කාහටද?

පහත කොන්දේසි සපුරාලයි නම් ඔබට Child Care Benefit (ළමා සුරැකුම් ප්‍රතිලාභ) ලබා ගත හැක:

- ඔබේ රැකවරණ ලබන දරුවකු ඔබට සිටී නම්
- ඔබේ දරුවා අනුමත හෝ ලියාපදිංචි සුරැකුම් සේවාවකට යැවේ නම් හා ළමා සුරැකුම් ගාස්තු ගෙවුමට ඔබ බැඳී සිටී නම්
- ඔබේ දරුවා ප්‍රතිශක්තිකරණ අවශ්‍යතා සපුරයි නම් (හෝ ඉන් නිදහස් කොට ඇති නම්)
- ඔබ හෝ ඔබේ සහකරු/කාරිය නිත්‍යවාසික අවශ්‍යතා සපුරයි නම් (හෝ ඉන් නිදහස් කොට ඇති නම්)

**Approved Child Care (ලියාපදිංචි ළමා සුරැකුම්)** Department of Families, Community Services and Indigenous Affairs (පවුල්, ප්‍රජා සේවා සහ ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව) මගින් අනුමත කරන ලද ළමා සුරැකුම් සේවා මගින් සපයයි. බොහෝ දිගු දින සුරැකුම්, පවුල් දිවා සුරැකුම්, පෙර හා පසු පාසල් සුරැකුම්, නිවාඩු කාල සැරැකුම්, ගෘහස්ථ සහ අනියම් සුරැකුම් සේවා අනුමත ළමා සුරැකුම් (Approved Child Care) වේ.

**Registered Child Care (ලියාපදිංචි ළමා සුරැකුම්)** යනු රැකියා සම්බන්ධ සුරැකුම් සඳහා Family Assistance Office (පවුල් උපකාරක කාර්යාලය) හා ලියාපදිංචි මුත්තනු මිත්තණියන්, ඥාතීන්, හිතමිතුරන් හෝ ආයාවරුන් මගින් ලබා ගන්නා සුරැකුම් වේ. එලෙසම තනි තනිව පෞද්ගලික පෙර පාසල් සහ බාලාංශ මෙන්ම පාසල් වේලාවන් වලට අමතර සුරැකුම් සහ අනියම් සුරැකුම් සේවාද සුරැකුම් සැපයීමට අදාළ වේ. ලියාපදිංචි සුරැකුම් සඳහා Child Care Benefit ලබා ගනු වස්, ඔබ සහ ඔබේ සහකරු/කාරිය රැකියා, අධ්‍යාපන, සහ පුහුණු පිරික්සුම සපුරාලිය යුතුය.

**අනුමත හෝරාවන්**

ළමා සුරැකුම් භාවිතා කරන සුදුසුකම් ලබන සියළු පවුල්වල සුරැකුම් ලබන සෑම දරුවකු සඳහාම සතියකට පැය 24ක් දක්වා Child Care Benefit (ළමා සුරැකුම් ප්‍රතිලාභ) ලබා ගත හැක:

- ඔබත් ඔබේ සහකරු/සහකාරියත් රැකියාවක, රැකියා සෙවීමක නියැලේ නම් හෝ අවම වශයෙන් සතියකට පැය 15ක් හෝ දෙසතියකට පැය 30ක් ඉගෙනුමක, පුහුණුවක නියැලේ නම් හෝ මෙකී අවශ්‍යතා වලින් නිදහස් කර ඇත්නම් ඔබට සතියකට පැය 50ක් දක්වා අනුමත ළමා සුරැකුම් ලබන සෑම දරුවකු සඳහාම Child Care Benefit ලබා ගත හැක.
- ඔබත් ඔබේ සහකරු/සහකාරියත් රැකියාවක, රැකියා සෙවීමක නියැලේ නම් හෝ සතිය තුළ යම් විටෙක ඉගෙනුමක, පුහුණුවක නියැලේ නම් හෝ මෙකී අවශ්‍යතා වලින් නිදහස් කර ඇත්නම් ඔබට සතියකට පැය 50ක් දක්වා ලියාපදිංචි ළමා සුරැකුම් ලබන සෑම දරුවකු සඳහාම Child Care Benefit ලබා ගත හැක.
- ඔබ හෝ ඔබේ සහකරු/කාරියට රැකියා, අධ්‍යාපන හෝ පුහුණු වගකීම් (රැකියා ස්ථානයට යාම ඒම සඳහා ගමනාගමනය ඇතුලත්ව) නිසා ඔබේ දරුවා රැකබලා ගැනීම සඳහා කාල වේලාව නැති නම් අනුමත හෝ ලියාපදිංචි සුරැකුම් ලබන සෑම දරුවකු සඳහාම පැය 50කට වඩා Child Care Benefit ලබා ගත හැක.

## ළමා සුරැකුම් ප්‍රතිලාභ කෙතරම් ප්‍රමාණයක් මාහට ලබා ගත හැකිද?

සියළුම තක්සේරු අගයන් 7/7/2008 දිනයට වලංගුව පවතී.

වාර්ෂිකව $36,573 හෝ ඊට අඩු ආදායමක් සහිත අනුමත සුරැකුම් උපයෝගී කර ගනු ලබන පවුල් සඳහා Child Care Benefit උපරිම තක්සේරු මුදල ලබා ගත හැක. පාසල් නොයන වයසේ සිටින දරුවකු සඳහා Child Care Benefit උපරිම තක්සේරු මුදල පැයකට $3.47 ක් හෝ සතියකට පැය 50කට $173.50ක් වේ. පාසල් යන දරුවකු සඳහා උපරිම තක්සේරු මුදල පාසල් නොයන දරුවකුගේ තක්සේරු මුදලින් සියයට 85ක ප්‍රතිශතයක් වේ. ළමා සුරැකුම් ලබන අමතර දරුවන් සඳහා මෙකී තක්සේරු මුදල වැඩි වනු ඇත.

We speak your language ✆ 13 1202

www.familyassist.gov.au

Australian Government
Family Assistance Office

ඔබේ පවුලේ ආදායම $36,573 කරා පැමිණීමේ දී Child Care Benefit තක්සේරු අගය අඩු වීමට පටන් ගනී. ඉහළ ආදායම් සීමාවන් වලට වඩා ආදායම් ලබන්නාවූ පවුල් තව දුරටත් අවම ළමා සුරැකුම් ප්‍රතිලාභ තක්සේරු අගයන් නොලබයි. ලබා ගත නොහැකි සීමාවන් නම්, එක දරුවකු සඳහා $126,793 පසුත්, දරුවන් දෙදෙනෙකු සඳහා $131,457 පසුත්, දරුවන් තිදෙනෙකු සඳහා $148,452 පසුත් සහ ඉන් පසු සුරැකුම්වල සිටින සෑම දරුවෙකු සඳහාම $28,020 වශයෙන්ද වේ. පවුල් සුරැකුම් ප්‍රතිලාභ සඳහා මෙම පවුල් ශූන්‍ය අනුපාතයට ඇගයීම් කරයි. මේ මගින් මෙම පවුල් සඳහා තව දුරටත් ළමා සුරැකුම් බදු වට්ටම් ලබා ගත හැක.

ලියාපදිංචි සුරැකුම් ලබන්නාවු පවුල් වලට පාසල් නොයන එක් දරුවකු සඳහා පැයකට $0.581 බැගින් සතියකට $29.05 ක උපරිමයක් පැය 50ක් සඳහා ලබා ගත හැක. පාසල් යන දරුවකුගේ අගය පාසල් නොයන දරුවකුගේ අගයෙන් සියයට 85කි. ලියාපදිංචි සුරැකුම් සඳහා ළමා සුරැකුම් බදු වට්ටම් නොලැබෙන බව දැනගැනීම වැදගත් වේ.

## ළමා සුරැකුම් බදු වට්ටම් ලබා ගත හැක්කේ කා හටද

පහත සියළු කොන්දේසි සපුරාලයි නම් ඔබටත් ළමා සුරැකුම් බදු වට්ටම් ලබාගත හැකි විය හැක:

- ඔබ විසින් අනුමත ළමා සුරැකුම් ලබා ගෙන ඇත්නම්
- ළමා සුරැකුම් ප්‍රතිලාභ ලැබීමට ඔබ සුදුසුයැයි තක්සේරු කර ඇත්නම්
- ඔබ සහ ඔබේ සහකරු (වට්ටම් ලබා ගැනීමේ අරමුණු සඳහා) රැකියා, පුහුණු, අධ්‍යාපන පරීක්ෂාව සපුරාලන අවස්ථාවන්හිදී

මා හට කොපමණ ළමා සුරැකුම් බදු වට්ටමක් ලබා ගත හැකිද?
2008 ජුලි මස සිට සුදුසුකම් ලත් පවුල් වලට අනුමත සුරැකුම් උදෙසා එක් දරුවකුට ළමා සුරැකුම් වියදම් සඳහා සියතින් වැයවුනු මුදලින් සියයට 50ක් $7500ක උපරිමයක් දක්වා එක් වසරකදී ලබා ගත හැකිය.

## වැඩිපුර විස්තර සඳහා:

- සිංහල භාෂාවෙන් තොරතුරු ලබා ගැනීම සඳහා දුරකථන අංක **13 1202** මගින් සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 8.00 සහ ප.ව 5.00 (EST) Family Assistance Office (පවුල් උපකාරක කාර්යාලය) අමතන්න.
- **www.familyassist.gov.au** වෙබ් අඩවියට පිවිසෙන්න.
- ඔබට ආසන්නයේම ඇති Medicare Australia කාර්යාලයන් Centrelink පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන් සහ ආදායම් බදු කාර්යාලයන්හි පිහිටා ඇති Family Assistance Office වෙත පිය නගන්න.